# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2444/21 - 2025 ජූලි මස 08 වැනි අඟහරුවාදා - 2025.07.08

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### ශ්‍රී ලංකා ගුරු සේවයේ ව්‍යවස්ථාව සංශෝධනය කිරීම - සංශෝධන අංක 03

පහත I කොටසෙහි සඳහන් පරිදි සංශෝධිත 2014 ඔක්තෝබර් මස 23 දිනැති අංක 1885/38 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද ශ්‍රී ලංකා ගුරු සේවා ව්‍යවස්ථා සංග්‍රහය පහත II කොටසෙහි දැක්වෙන ආකාරයට නැවත සංශෝධනය කරනු ලැබේ. එහි සඳහන් අනෙකුත් කරුණු හා කොන්දේසි නොවෙනස්ව පවතී.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියෝගය පරිදි,

නාලක කළුවැව,
ලේකම්,
අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ
වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය.

2025 ජූලි මස 07 වැනි දින.

**I කොටස**

සංශෝධන අංක 01 - 2019 අප්‍රේල් මස 22 වැනි දින හා අංක 2120/2 *අති විශෙෂ ගැසට් පත්‍රය*

සංශෝධන අංක 02 - 2021 නොවැම්බර් මස 24 වැනි දින හා අංක 2255/14 *අති විශෙෂ ගැසට් පත්‍රය*

**II කොටස**

08. කාර්යක්ෂමතා කඩඉම් :

8.1. සේවයේ ගුරුවරුන් පහත දැක්වෙන පරිදි නියමිත කාර්යක්ෂමතා කඩඉම් සම්පූර්ණ කළ යුතු ය.

| *කුමන කාර්යක්ෂමතා කඩඉමද යන වග* | *අදාළ වන ශ්‍රේණිය* | *කාර්යක්ෂමතා කඩඉම සමත්විය යුත්තේ කොපමණ වසර ගණනකට පෙර ද* | *කාර්යක්ෂමතා කඩඉමේ ස්වභාවයඃ ලිඛිත පරීක්ෂණය/ වෘත්තීය පරීක්ෂණය/ සහතික පාඨමාලා/වෙනත්* |
|---|---|---|---|
| I වන කාර්යක්ෂමතා කඩඉම | 3 පන්තිය II ශ්‍රේණිය<br>3 පන්තිය I ශ්‍රේණිය<br>13.8 හි සඳහන් අධ්‍යාපනවේදී උපාධි සුදුසුකම මත 2 පන්තියේ II ශ්‍රේණියට බඳවාගත් ගුරුවරුන් | අදාළ ශ්‍රේණියට පත් වී වසර තුනක් (03) ගත වීමට පෙර | ලිඛිත පරීක්ෂණය උපලේඛන 01 |
| II වන කාර්යක්ෂමතා කඩඉම | 13.8 හි සඳහන් අධ්‍යාපනවේදී උපාධි සුදුසුකම මත 2 පන්තියේ II ශ්‍රේණියට බඳවාගත් ගුරුවරුන් හැර 2 පන්තියේ II ශ්‍රේණියට උසස් වූ/ පත්කරන ලද අනෙකුත් ගුරුවරුන් | 2 පන්තියේ II ශ්‍රේණියට උසස් වී/ පත් වී වසර හතරක් (04) ගතවීමට පෙර | ලිඛිත පරීක්ෂණය උපලේඛන 01 |
| III වන කාර්යක්ෂමතා කඩඉම | 2 පන්තිය I ශ්‍රේණිය | 2 පන්තියේ I ශ්‍රේණියට උසස් වී වසර හතරක් (04) ගතවීමට පෙර | ලිඛිත පරීක්ෂණය උපලේඛන 01 |

8.2. පරීක්ෂණ පවත්වනු ලබන්නේ කොපමණ කාලයකට වරක්දඃ වර්ෂයකට දෙවතාවක් පවත්වනු ලැබේ.

8.3. පරීක්ෂණය පවත්වනු ලබන බලධරයාඃ පත්කිරීම් බලධරයා හෝ පත්කිරීම් බලධරයා විසින් බලය පවරන ලද බලධරයන් විසින් හෝ පත් කිරීම් බලධරයා විසින් තීරණය කරනු ලබන වෙනත් සුදුසු ආයතනයක් මගින් පත්කිරීම් බලධරයා විසින් නියම කරනු ලබන මාර්ගෝපදේශ පරිදි පවත්වනු ලැබේ.

8.4. කාර්යක්ෂමතා කඩඉම සම්පූර්ණ කිරීම සඳහා අදාළ අනෙකුත් විධිවිධාන

(i) සේවයේ 3 පන්තිය සඳහා බඳවාගත් ගුරුවරුන් 2 පන්තියේ II ශ්‍රේණියට උසස් වීම සඳහා පළමුවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය සමත් විය යුතුය. එහෙත් ව්‍යවස්ථාවේ 7.2.6.2, 7.2.6.4, 7.2.6.5 හා 7.2.6.6 හි සඳහන් විධිවිධාන යටතේ 2 පන්තියේ II ශ්‍රේණියට පත්වන අවස්ථාවකදී 3 වන පන්තියට නියමිත කාර්යක්ෂමතා කඩඉම සම්පූර්ණ කර තිබීම අවශ්‍ය නොවේ. එහෙත් එලෙස පත් වූ ගුරුවරුන් 2 පන්තියේ II ශ්‍රේණියේදී සේවයේ මුල් පත්වීමේ දින සිට වසර තුනක් (3) තුළදී පළමු කාර්යක්ෂමතා කඩඉම සමත් විය යුතුය. ඊට අමතරව ඔවුන් 2 පන්තියේ II ශ්‍රේණියට නියමිත දෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය 2 පන්තියේ II ශ්‍රේණියට උසස් වූ දින සිට වසර හතරක් (4) තුළදී සම්පූර්ණ කළ යුතුය.

**10. ශ්‍රේණි උසස් කිරීම් :**

10.1.1.1. (iii) - අනුමත කාර්යසාධන ඇගයීමේ පරිපාටිය අනුව උසස් කිරීමේ දිනට පූර්වාසන්න වසර පහ (05)ක් තුළ සතුටුදායක හෝ ඊට ඉහළ කාර්ය සාධනයක් පෙන්නුම් කර තිබීම.

10.2.1.1. (iii) - අනුමත කාර්යසාධන ඇගයීමේ පරිපාටිය අනුව උසස් කිරීමේ දිනට පූර්වාසන්න වසර තුන (03)ක් තුළ සතුටුදායක හෝ ඊට ඉහළ කාර්ය සාධනයක් පෙන්නුම් කර තිබීම.

10.3.1.1.1. (iv) - අනුමත කාර්යසාධන ඇගයීමේ පරිපාටිය අනුව උසස් කිරීමේ දිනට පූර්වාසන්න වූ වසර නවය (09)ක් තුළ සතුටුදායක හෝ ඊට ඉහළ කාර්ය සාධනයක් පෙන්නුම් කර තිබීම.

10.3.2.1.1. (iv) - අනුමත කාර්යසාධන ඇගයීමේ පරිපාටිය අනුව උසස් කිරීමේ දිනට පූර්වාසන්න වූ වසර හත (07)ක් තුළ සතුටුදායක හෝ ඊට ඉහළ කාර්ය සාධනයක් පෙන්නුම් කර තිබීම.

10.3.3.1.1. (iv) - අනුමත කාර්යසාධන ඇගයීමේ පරිපාටිය අනුව උසස් කිරීමේ දිනට පූර්වාසන්න වූ වසර හත (07)ක් තුළ සතුටුදායක හෝ ඊට ඉහළ කාර්ය සාධනයක් පෙන්නුම් කර තිබීම.

10.3.4.1.1. (iv) - අනුමත කාර්යසාධන ඇගයීමේ පරිපාටිය අනුව උසස් කිරීමේ දිනට පූර්වාසන්න වූ වසර පහ (05)ක් තුළ සතුටුදායක හෝ ඊට ඉහළ කාර්ය සාධනයක් පෙන්නුම් කර තිබීම.

10.4.1.1. (iv) - අනුමත කාර්යසාධන ඇගයීමේ පරිපාටිය අනුව උසස් කිරීමේ දිනට පූර්වාසන්න වූ වසර පහ (05)ක් තුළ සතුටුදායක හෝ ඊට ඉහළ කාර්ය සාධනයක් පෙන්නුම් කර තිබීම.

11.2.3. - ඉවත් කරනු ලැබේ.

"ඈ" පරිශිෂ්ඨය - ඉවත් කරනු ලැබේ.

**උපලේඛන 01**

කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ ක්‍රියාත්මක වන ආකාරය

01. කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ, අධ්‍යාපන විෂයභාර අමාත්‍යාංශයේ නිල වෙබ් අඩවියේ පළ කරනු ලබන ස්වයං අධ්‍යයන මොඩියුල ආශ්‍රයෙන් පැවැත්වේ. මෙම මොඩියුල අධ්‍යාපන විෂයභාර රේඛීය අමාත්‍යාංශය විසින් අවශ්‍යතාවය මත වරින් වර සංශෝධනය කරනු ලැබේ.

02. විෂය නිර්දේශය :

| *කාර්යක්ෂමතා කඩඉම* | *අදාළ වන මොඩියුල* |
|---|---|
| I වන කාර්යක්ෂමතා කඩඉම | 1. ගුරු නිපුණතා රාමුව හා ගුරු වෘත්තිකභාවය |
| | 2. ඉගැන්වීමේ ක්‍රමවේදය |
| | 3. අධ්‍යාපනය සඳහා ඩිජිටල් තාක්ෂණය |
| | 4. අධ්‍යාපනයට අදාළ නීතිය |
| II වන කාර්යක්ෂමතා කඩඉම | 5. නායකත්ව සංවර්ධනය හා කළමනාකරණය |
| | 6. ක්‍රියාකාරකම් සැලසුම් සකස් කිරීමේ ඵලදායි ක්‍රම ශිල්ප |
| | 7. පන්ති කාමර කළමනාකරණය සහ අන්තර්කරණ අධ්‍යාපනය |
| III වන කාර්යක්ෂමතා කඩඉම | 8. කායික හා මානසික යහපැවැත්ම |
| | 9. විසි එක්වන සියවසේ පාසල |
| | 10. ක්‍රියාමූලික පර්යේෂණ |

03. එක් එක් කාර්යක්ෂමතා කඩඉම් සඳහා වන ලිඛිත පරීක්ෂණ එම අදාළ මොඩියුල ආවරණය වන සේ පහත පරිදි සකස් විය යුතුය.

| *ව්‍යුහය* | *ප්‍රශ්න සැකැස්ම* | *කාලය* | *ලකුණු* |
|---|---|---|---|
| I පත්‍රය | බහුවරණ | පැය 01 | 40 |
| II පත්‍රය | කෙටි ප්‍රශ්න | පැය 02 | 60 |

04. සාමාර්ථය සඳහා I පත්‍රය හා II පත්‍රය ලකුණු වල එකතුව 40% ඉක්මවන සේ ලබාගත යුතුය.

05. ලිඛිත පරීක්ෂණය සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යයෙන් පැවැත්වේ. අයදුම්කරුවන්ගේ මනාපය පරිදි එක් මාධ්‍යයකින් පරීක්ෂණය සඳහා පෙනී සිටිය හැක.

EOG 07 - 0088

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.